කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි/අධ්‍යයන ධාරා අවසාන පරීක්ෂණය (භූගෝල විද්‍යාව)-පළමු භාගය

දෙවන සෙමෙස්තරය -2022/**2023**

**GYG** 2231 - කාලගුණ විද්‍යාව සහ දේශගුණ විද්‍යාව

කාලය**:** පැ දෙකයි (02)

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

.......... ..................................................................................................................

1. (i) කාලගුණය සහ දේශගුණය අතර වෙනස දක්වන්න. (ලකුණු 03)

   (ii) දේශගුණවිද්‍යාත්මක පර්යේෂණ සඳහා 30-අවුරුදු සම්මත කාලපරිච්ඡේද භාවිත කිරීමේ වාසි පැහැදිලි කරන්න. (ලකුණු 07)

   (iii) "වර්තමානයේදී, රටවල් විසින් ආන්තික සිදුවීම් කාලගුණික අවස්ථා කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතුය." මෙම අදහස සමඟ ඔබ එකඟ වන්නේද? උදාහරණ ගෙන හැර දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

2. (i) සූර්යය විකිරණය හා සම්බන්ධ **Stefan Boltzmann** ගේ නීතිය දක්වන්න. (ලකුණු 03)

   (ii) පෘථිවියට ලැබෙන සූර්යය විකිරණය බෙදා හැරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

   (iii) වර්ධනය වූ හරිතාගාර ආවරණය පෘථිවි තාප තුලාව වෙනස් කරනුයේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

3. (i) ක්ෂුද්‍ර පරිමාණයේ වායු චලන තුනක් නම් කරන්න. (ලකුණු 03)

   (ii) කෝරියෝලිස් බලය පෘථිවි අර්ධගෝල දෙක මත බලපාන අයුරු රූප සටහනක් භාවිතකොට ගනිමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07)

   (iii) "වායුගෝලීය සංසරණය පෘථිවි දේශගුණයෙහි ප්‍රධාන අංගයකි." මෙම ප්‍රකාශය සම්බන්ධව ඔබගේ අදහස සාකච්ඡා කරන්න. (ලකුණු 10)

4. (i) වායු අභිසරණයට හේතුවන පොදු ක්‍රියාවලි තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) රූප සටහනක් ඇසුරෙන් වියළි පතන සීඝ්‍රතාව විස්තර කරන්න. (ලකුණු 07)

(iii) උන්නතාංශය අනුව බිහිවන විවිධ වලාකුළු වර්ගකර ඒවායේ කලගුණික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. (i) නිවර්තනික වාසුළි ජනිතවන විවිධ ප්‍රදේශ සහ ඒවා සඳහා භාවිත ප්‍රාදේශීය නාම කවරේද? (ලකුණු 03)

(ii) උණුසුම් සාගරයක් මත පමණක් නිවර්තනික වාසුළි හට ගන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) නිවර්තනික වාසුළියක් සෞම්‍ය කලාපීය වාසුළියකින් වෙනස් වන්නේ කෙසේදැයි විමසන්න. (ලකුණු 10)

6. (i) සාගරික ගයර (Gyres) යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද? (ලකුණු 03)

(ii) සාගරයක උත්කුපායන ක්‍රියාවලියෙහි සහ යටිකුරුවීමේ ක්‍රියාවලියෙහි වැදගත්කම කෙටියෙන් විමසන්න. (ලකුණු 07)

(iii) පෘථිවි වායුගෝලීය ක්‍රියාවලිය කෙරෙහි සාගරවල කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

●●●●●●●●●●